■ **01 සිට 40 දක්වා සෑම පිළිතුරකට ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න. පරීක්ෂකවරුන් සමග කථාවට නොයන්න. ප්‍රශ්න වැරදි නම් ඔබට ලකුණු හිමි වේ.**


01. නිවැරදි අදහසක් ගෙනෙන වාක්‍යය තෝරන්න.


1. අපට ජීවත් වීමට අයිතිය ඇතත් සතුන්ට නැත.
2. අපට නොව සතුන්ට මේ ලොව ජීවත් වීමට අයිතිය ඇත.
3. අපට මෙන්ම සතුන්ට ද මේ ලොව ජීවත් වීමට අයිතිය ඇත.


02.


1. අනුන්ට උදව් උපකාර කිරීම කළ යුතු දෙයක් නොවේ.
2. අනුන්ට උදව් උපකාර නොකළ යුතු දෙයක් නොවේ.
3. නොකළ යුතු උදව් උපකාර අනුන්ට කළ යුතුය.


■ **පහත රූප දෙස බලන්න.**


A


B


C


D


E

03. වඩාත් නිවැරදි ලෙස කාණ්ඩ කර ඇති සතුන් යුගලය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. A, D  2. B, C  3. B, D

04. මේ අතරින් වඩාත්ම කුඩා සත්වයා වනුයේ,

1. B  2. D  3. E

**කළු කර ඇති වචන කිහිපය වෙනුවට යෙදිය හැකි එකම එක වචනය තෝරන්න.**

05. අලුත් ගවුමක් මසා ගැනීමට මිනෝලි **ඇඳුම් මසන තැනැත්තිය** හමුවීමට ගියාය.

1. සන්නාලියා  2. සපතේරුවා  3. සන්නාලිය

06. ඉදිරියට **වැස්ස නොමැති කාලයක්** උදා වන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනාවැකි පවසයි.

1. දුර්භික්ෂයක්  2. ඉඩෝරයක්  3. නරක කාලයක්

■ මෙම සම්බන්ධය බලන්න.

| | | | |
|---|---|---|---|
| අඹ 1 | + | පේර 2 | = රුපියල් 100.00 |
| දොඩම් 1 | + | අඹ 2 | = රුපියල් 150.00 |

07. අඹ 2 + පේර 4 මිල වනුයේ රුපියල්,

1. 250   2. 200   3. 150

08. දොඩම් 2 + අඹ 4 මිල වන්නේ රුපියල්

1. 300   2. 400   3. 600

♦ මුලින් දැක්වෙන වචන යුගලයට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.

09. ආලෝකය - උණුසුම

1. 

2. 

3. 

10. කාලය - පිළිවෙළ

1. 


2. 


3. 


♦ සම්බන්ධතාව වැඩියෙන් ම පෙන්වන රූප යුගලය ඇති කොටුව තෝරන්න.

11. 1. 

2. 

3. 

12. 1. 

2. 

3. 


13. 6 වන දවසේ රොටී අලෙවිය කීයක් විය හැකි ද?

1. 40 2. 45 3. 55


14. යම් දවසක ආපනශාලාවෙන් අලෙවිය නැවතිය හැකි ආහාරය කුමක් ද?

1. පිට්ටු 2. තල කැරලි 3. බනිස්

15. අඳුරු කර ඇති කොටස මුළු රූපයේ භාගයක් ලෙස දැක්වෙන පිළිතුර තෝරන්න.



1. $\frac{1}{2}$ කි. 2. $\frac{1}{2}$ අඩුය 3. $\frac{1}{2}$ වැඩිය

16. 

1. $\frac{1}{8}$ 2. $\frac{1}{6}$ 3. $\frac{1}{4}$

17. තමන් නොකළ වරදකට දඬුවම් විඳීමට සිදුවීම සම්බන්ධ යෙදුම වන්නේ,

1. පරංගියා කෝට්ටේ ගියා වගේ
2. අනුන්ගේ පානෙන් එළිය බලනවා වගේ
3. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ

■ පාසලක අලුතින් ආරම්භ කරන ලද ආපනශාලාවක පළමු දින පහේ අලෙවි වූ ආහාර පිළිබඳව විස්තරයක් මින් දැක්වේ.

| ආහාර වර්ගය | 1 දින | 2 දින | 3 දින | 4 දින | 5 දින |
|---|---|---|---|---|---|
| ඉදි ආප්ප | 400 | 425 | 450 | 475 | 500 |
| පිට්ටු කෑලි | 85 | 83 | 81 | 79 | 77 |
| රොටී | 40 | 40 | 40 | 40 | 40 |
| බනිස් | 35 | 50 | 35 | 50 | 35 |
| පේස්ට්‍රි | 100 | 101 | 102 | 103 | 104 |
| තල කැරලි | 75 | 80 | 40 | 30 | 60 |

18. ''ඇඟිල්ලේ තරමට ඉදිමුව'' යන ආප්තෝපදේශයෙහි තේරුම වනුයේ,

1. ඇඟිල්ලට දැමිය යුතතේ ඊට ගැළපෙන මුද්දකි
2. මුද්දේ තරමට ඇඟිල්ල තිබිය යුතුය
3. තමන්ගේ ප්‍රමාණය අනුව වැඩ කටයුතු කළ යුතු බවය.

19. කොතරම් මුදල් හදල් තිබුණත් කළු මුදලාලි කිසිවෙකුට උදව් නොකරයි. කිසිවක් නොදෙයි. ඔහු හැඳින්වීමට වඩාත් සුදුසු වචනය වනුයේ,


1. මසුරා     2. ධනපතියා     3. අවංකයා

20. රටට ආදරය කරන රෝහණ රටේ දේවල් පිටරටියන්ට විකිණීමට එරෙහි වී කටයුතු කරයි. ඔහු හැඳින්වීමට වඩාත් සුදුසු යෙදුම,

1. දේශප්‍රේමී     2. කාලකණ්ණි     3. විරුද්ධවාදී


■ **පහත සංඛ්‍යා රටා තේරුම් ගෙන ඊළඟට පැමිණිය යුතු පිළිතුර තෝරන්න.**

21.




1. 30     2. 28     3. 25


22.





1. 65     2. 75     3. 85

■ **රූපවල දැක්වෙන සම්බන්ධතාව තේරුම් ගෙන ඊළඟට ගැළපෙන පිළිතුර තෝරන්න.**

23.





24.




■ පහත සඳහන් ඉලක්කම් කාණ්ඩය දෙස බලා 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| |
|---|
| 1 , 2 , 3 , 4 |
| 5 , 6 , 7 |
| 0 , 8 , 9 |

25. මේ රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීයද?




1. 5 2. 6 3. 7




26. මෙහි සමචතුරස්‍ර ගණන කීයද?

1. 5 2. 6 3. 9

■ පහත රූප උඩ සිට බලන විට පෙනෙන අන්දම තෝරන්න.

27. 

1. 2. 3.

28. 

1. 2. 3.


29. දෙකෙන් ඉතිරි නැතිව බෙදෙන ඉලක්කම් ගණන කීයද?

1. 5 2. 4 3. 3

30. තුනෙන් බෙදූ පසු දෙකක් ඉතිරි වන සංඛ්‍යා ගණන කීයද?

1. 2 2. 3 3. 1

■ පහත සටහන බලා 31 හා 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




31. සුවඳ මල් ගණන කීයද?

1. 5  2. 9  3. 4

32. සුදු මල් ගණන කීයද?

1. 11  2. 7  3. 4

■ පහත සඳහන් ඵලයන් සඳහා හේතුව ලෙස ගත හැකි පිළිතුරු තෝරන්න.

33. සුලෝචනාගේ කාරය ඉදිරියටම ඇදෙයි.

1. කාරය පණ ගැන්වීම  2. රෝද කරකැවීම
3. රියදුරා පැදවීම

34. සූර්යයා උදාවෙයි

1. සූර්යයා කරකැවීම  2. පොළොවේ කරකැවීම
3. ස්වභාවධර්මය අනුව එසේ විය යුතුය.

35. කාලය නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුර වේ.

1. අවුරුද්ද - මාසය - දිනය - සතිය - විනාඩිය
2. තත්පරය - විනාඩිය - පැය - දවස - සතිය
3. සතිය - මාසය - අවුරුද්ද - දවස - පැය

36. විශාලත්වය අනුපිළිවෙළ තෝරන්න.

1. පිඟාන - පළඟාන - හැන්ද - තසිම - දීසිය

2. කෝප්පය - ජෝගුව - බාල්දිය - බේසම - බැරලය

3. ජෝගුව - කෝප්පය - ළිඳ - බාල්දිය - බේසම

37. අනෝජාට එකවර ගෙන යා හැක්කේ පොල් ගෙඩි 5 පමණි. ගෙඩි 27 ගෙන යාමට පැමිණිය යුතු වාර ගණන කීයද?

1. 5 2. 6 3. 7

38. පිට්ටනියක් වටා අඹ පැළ දෙකක් මැදට කොට්ටන් පැළයක් සිටුවයි. කොට්ටන් පැළ 22කි. අඹ පැළ ගණන කීයද?

1. 22 2. 11 3. 33

39. ගමක වැඩිපුරම තිබිය හැක්කේ,

1. පාරවල් 2. ගංගාවල් 3. ගෙවල්

40. නැන්දා යනු නිතරම

1. දුවෙකි 2. මවකි 3. වියපත් අයෙකි

# රේඩියෝ ගුරුවරයා



අංක 4 | II පත්‍රය | පැය. 01 මිනිත්තු 15

1) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට ඡේදයෙන්ම පිළිතුරු ලියන්න.

"... නිල්වන් කඳු වළල්ල නිසොල්මනේ පසුවෙයි. එකිනෙක උස් වූ කඳු වැටි එකිනෙකට පසුපසින් මතුවී හිස ඔසවා තැනිතලාවට මුහුණලා සිටගනී. කඳු මත වූ විශාල ගල්තලාවන් මතින් ඇදහැලෙන රිදී රේඛා වැනි දියඇලි කඳුකරයේ අඳින ලද මෝස්තරයක් වැනිය. කඳුපෙළ පාලනය කරන සෙන්පතියකු වැනි වාළිඹේ හෙළ කුඩා ළමයින් රසක් වටකරගත් ගුරුවරයකු මෙන් ගෞරවාන්විතව නැඟී සිටියි ..."

වනේ ඇඳුණු පියසටහන් - පියසේන කහඳගමගේ

i. මෙම ඡේදයේ කියවෙන්නේ කුමන ස්ථානයක් ගැන ද ?.......................
ii. මෙහි නිසොල්මන්ව පසු වන්නේ කුමක්ද ?...............................................
iii. "කඳුකරයේ අඳින ලද මෝස්තරයක් වැනිය" මෙලෙස උපමා කර ඇත්තේ කුමක්ද?.............
iv. "ඖ" ශබ්දය දෙන පිල්ලම යෙදුණු වචනයක් ඡේදයෙහි ඇත. එය කුමක්ද?.........................
v. "උස්" යන පදයට විරුද්ධාර්ථ පදය ලියන්න. ....................................
vi. "ගුරුවරයකු" යන පදයේ උක්ත පදය ලියන්න. ....................................

ලකුණු06

2) සුදුසු ක්‍රියාපදය වරහන තුළින් තෝරා ලියන්න.

I. ගෙයි අටු කොටු ................... (පිරෙයි/පිරෙති).
II. කිරි කුරහන් ......................(පිදෙති/පිදෙයි)

ලකුණු02

3) පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

බෝනොවන්නට/නිතර/කොරෝනා/අපි/රෝගය/දෑත්/පිරිසිදු/සෝදා/වෙමු.

..........................................................................................................................

ලකුණු01

4) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ නිවැරදි වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

I. සීගිරිය අපේ රටේ ..........................(පවුරානික/ පෞරාණික) ස්ථාන අතරින් එකකි.
II. හිරු රශ්මිය වා ........................( කවුලුවෙන්/කවුළුවෙන්) නිවසට එබිකම් පායි.

ලකුණු 02

5) පහත දැක්වෙන කවියෙහි ඉතිරි පදය සම්පූර්ණ කරන්න.

ඉර පායන තෙක් නිදනා
අයගේ වැඩ පමා වෙනා
අරුණට පළමුව එයිනා
.....................................................................................

ලකුණු01

6) "සුදුසු නුසුදුසු දේ විචාර බුද්ධියෙන් නොවිමසා කතා කිරීම." යන අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

..................................................................................................................................................

ලකුණු 01

7) වර්තමාන සිංහල හෝඩියේ ඇති මහප්‍රාණ අක්ෂර නම් කරන්න
.......................................... ..........................................................................................

ලකුණු 01

8) පහතදැක්වෙනපදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

I. ගැළපෙන - ....................................
II. ආරම්භය - ................................................

ලකුණු 02

9) පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. ගුරුතුමිය වයලීනය වාදනය..........................................(කළාය / කළේය).
ii. රවිඳුත් සඳුනිත් අග්ගලා.............................................................(කති/කයි) .

ලකුණු 02

10) හිස්තැන පුරවා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1) ගහ අද්දර කැලේ කෘතිය ...................,............................................... මහතා විසින් රචනා කරන ලදී.

ලකුණු01

11) පහත සඳහන් තේරවිල්ලට අදාළ පිළිතුරු ලියන්න.

a. ගසක නොපිපෙන මල - ...........................................

ලකුණු01

12) සුදුසු අකුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

I. කායික්......ම(ශ/ෂ)
II. කැකු....... මල් (ලු / ළු)

ලකුණු01

13) පහත දැක්වෙන ඉංග්‍රීසි වචන සඳහා නිවැරදි අකුර යොදා හිස්තැන් පුරවන්න.

i. Eleph.......nt
ii. Sharp......ner
iii. Clo......ds

ලකුණු03

14) පහත දැක්වෙන සිංහල වචනවල අර්ථය ඉංග්‍රීසියෙන් ලියන්න.

i. එළවළු - ...................................
ii. දේදුන්න - ...................................

ලකුණු02

15) පහත දැක්වෙන වාක්‍ය ඉංග්‍රීසියෙන් ලියන්න.

I. මම කතන්දර පොත්වලට ආසයි - ...............................................................................

ලකුණු 01

16) පහත දැක්වෙන සිංහල වාක්‍ය දෙමළ භාෂාවෙන් ලියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

i. මට වඩේ දෙකක් දෙන්න.- ..............................................................................................

ලකුණු 01

17) පහත දැක්වෙන දෙමළ වාක්‍යයේ සිංහල තේරුම ලියන්න.

i. එනක්කු ඕර් අණ්ණා ඉරුක්කිරාර් -.......................................................................................

ලකුණු 01

18) ගස්වැල් සොබාදහමෙන් අපට ලැබී ඇති දායාදයකි. වනාන්තර සුරැකීම නිසා පරිසරය ආරක්ෂා වෙයි. " වනාන්තරයක අසිරිය" යන මාතෘකාව යටතේ වැකි3ක් ලියන්න. (සෑම වැකියකම වචන පහකට වඩා නොඅඩු විය යුතුය. උක්ත/ ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

.........................................................................................................
.........................................................................................................
.........................................................................................................

- දී ඇති තිත්ඉරි මත පිළිතුරු ලියන්න.

19) අකුරෙන් දී ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.
හැත්තෑ නව දහස් හැට නවය - ......................................

20) 7,8,6,2 යන ඉලක්කම් යොදාගෙන සෑදිය හැකි විශාලම හා කුඩාම සංඛ්‍යා අතර වෙනස කීයද?
.....................................

21) තුෂාරි ගේ බර 21 kg වේ. නාමලීගේ බර තුෂාරිගේ බර මෙන් තුන් ගුණයකට වඩා 3 ක් වැඩිය.
නාමලීගේ බර කොපමණද ? .............................................................................


22) පරිප්පු 1kgක් රු:160.00 කි. තේ කුඩු 1kgක් රු: 880.00කි. පරිප්පු 250gක් හා තේ කුඩු 500gක් මිලදී ගත් අයකු ගෙවිය යුතු මුදල කීයද? ..........................................................................

23) ගොඩක ඇති අඹ ගෙඩිවලින් 1 / 4 ක් ඉදී ඇත. ඉතිරි ඒවා අමුය. අමු අඹ ගණන 45ක් නම්, ගොඩෙහි ඇති මුළු අඹ ගණන ලියන්න. ..........................................................................

24) පාසලක චිත්‍ර තරගයක් පැය11 : 15 ට ආරම්භ වී පැය 2 මිනිත්තු 40කින් අවසන් විය. තරගය අවසන් වූ වේලාව සම්මත ඔරලෝසු වේලාවෙන් ලියන්න. පැය .....................................

25) මෙහි ඇතිත්‍රිකෝණගණනලියන්න.

.........................................................



26) පාට පැන්සල් 300 කින් 60ක් ඉතිරි කර අනෙක් සියල්ල පෙට්ටියකට 6 බැගින් වන සේ කුඩා පෙට්ටිවල ඇසිරීමට අවශ්‍ය කුඩා පෙට්ටි ගණන කොපමණද?
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

27) පහත දී ඇති සංඛ්‍යා පිළිවෙළ අනුව සංඛ්‍යා රටාවක් ලබාගැනීමට ඉවත් කළ යුතු සංඛ්‍යාව කුමක්ද?
9, 18, 36, 62, 72, 144 – . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

28) 0. 3 භාගයක් ලෙස ලියා දක්වන්න. . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

29) පන්තියේ බිත්තිවල ගෑම සඳහා තීන්ත ලීටර 3 ක් අවශ්‍ය වේ. තීන්ත මිලදී ගන්නේ ලීටර භාගයේ ටින් ලෙසයි. ටින් එකක මිල රුපියල් 440. 00 කි. තීන්ත සඳහා වැය වූ මුදල කීයද?
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

30) නිමල් කන්තෝරුවට ගොස් පෙ. ව. 8. 35සිට ප. ව. 4. 30 දක්වා එහි රැඳී සිට ඉන් පිටවී ප. ව. 5. 50ට නිවසට පැමිණියේය.

නිමල් කන්තෝරුවේ රැඳී සිටි කාලය කොපමණද? .................................................
නිමල් කන්තෝරුවේ සිට නිවසට ඒමට කොපමණ කාලයක් ගතවීද? ..................

31) එකතු කරන්න.

8596
+1316
________

========

● සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

32) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමට අදාළ තෙවන පියවර වන්නේ,

උදානය/ අධිෂ්ඨානය/ මානසික ලිහිල් බව

33) උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථයක් නොවේ.
සුභාෂිතය/ සිදත් සඟරාව/ ලෝකෝපකාරය

34) ජාතික ගීය රචනා කළේ කවුද?
සාගර පලන්සූරිය මහතා / ආනන්ද සමරකෝන් මහතා/ මහගම සේකර මහතා

35) අපේ රටේ ජාතික උරුමයක් වනුයේ,
ජාතික කෞතුකාගාරය/ දෙහිවල සත්වෝද්‍යානය / සිංහරාජ වනාන්තරය

36) පොකුරු කාණ්ඩයට අයත් මල් වර්ගයකි.
සූරියකාන්ත/ වතුසුදු/ ඇන්තූරියම්

37) පැණි සකස් කිරීමට යොදා ගන්නා ශාකයකි,
දෝතලු / කිතුල්/ පුවක්

38) මල් සහ කොළ යන දෙවර්ගයම ආහාරයට ගන්නා ශාකය කුමක්ද?
ගොටුකොළ / තම්පලා / කතුරුමුරුංගා

39) ශ්‍රී ලංකාවට ආවේණික නොවන උරගයෙකි,
යක් කටුස්සා / දිය නයා / මල්පුලුට්ටා

40) කාලගුණය පිළිබඳව අනාවැකි ලබා දෙන සතකු ලෙස හඳුන්වන්නේ,
පළහැටියා/ මෙරුවා/ කණාමැදිරියා

41) කොට්ට උරයකට මලක් මැසීමේදී යොදාගත හැකි විසිතුරු මැහුම් ක්‍රමයක් වන්නේ,
බ්ලැන්කට් මැස්ම / දම්වැල් මැස්ම / ප්‍රිස්මේන්තු මැස්ම

42) සබරගමුව පළාතට අයත් වන නගරය කුමක්ද?
රත්නපුරය / ගම්පහ / කතරගම

43) භාණ්ඩයක ප්‍රමිතිය තහවුරු කරන්නේ,
SLS ලාංඡනය /නිෂ්පාදිත දිනය / ලියාපදිංචි අංකය

44) මෙම රූපයෙන් දැක්වෙන්නේ,

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව/ මාර්ග සංවර්ධන අධිකාරිය / ඉන්ධන පිරවුම්හල

45) සිතියමක අධිවේගී මාර්ග දක්වන සම්මත වර්ණය වන්නේ,
කළු. / දම්. / රතු

46) සිදුරු කැමරාවකින් තිරය මත වැටෙන ප්‍රතිබිම්බය සෑම විටම,
උඩුකුරු වෙයි / යටිකුරුව වැටෙයි / විශාලව වැටෙයි

47) විටමින් D බහුල ආහාරයකි,
බිත්තර / අන්නාසි / කැරට් කොළ

48) මේ අතරින් දෘශ්‍ය මාධ්‍යයක් නොවන්නේ,
පුවත්පත. / අත් පත්‍රිකා. / රූපවාහිනිය

49) ඉංග්‍රීසි කොඩිය බිම දමා පාගා දැමුවේ,
මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමි / වාරියපොල ශ්‍රී සුමංගල හිමි / සරණංකර සංඝරාජ නා හිමි



50) මෙම රූපයෙන් දැක්වෙන්නේ,
කැස්ටර් වීල්එකකි / කප්පියකි / බොලොක්කයකි

51) ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි,
මාතලේ අලුවිහාරය / දඹුලු විහාරය / ඇම්බැක්කේ දේවාලය

52) චුම්බකයකට ආකර්ශණයවන දෙයකි,
ඇල්පෙනෙති / ප්ලාස්ටික් / රබර්

53) නිවසේ විදුලිය තිබේදැයි පරීක්ෂා කිරීමට යොදා ගන්නා උපකරණය වනුයේ,
පීර / ටෙස්ටර / ඉස්කුරුප්පු නියන

54) රාජ්‍ය ආයතනවලින් සැපයෙන සේවා සම්බන්ධ තොරතුරු දැනගැනීමට ඇමතිය යුතු දුරකථන අංකය නම්,

1717. / 1989. / 1919

55). ජල බඳුනකට දැමූ විට ජලය මත පාවෙන ද්‍රව්‍යයක් වන්නේ,

විනාකිරි / භූමිතෙල්/ එළකිරි

56) ආතර් සී ක්ලාක් මහතා ප්‍රසිද්ධ වනුයේ,

තාරකා විද්‍යාවට. / කලා නිර්මාණවලට / ක්‍රීඩා ක්ෂේත්‍රයට

57) හාල් මැස්සන්වල වැඩිපුරම ඇති පෝෂ්‍ය පදාර්ථය කුමක්ද?

කාබෝහයිඩ්‍රේට් / ප්‍රෝටීන් / කැල්සියම්

58) "වළාකුලින් බැස සමන් කුළත් වැඳ එලෝ බලා යනවා......." ගීතයේ පද රචනය කාගේද?

සුනිල් ශාන්ත මහතා / අරිසෙන් අහුබුදු මහතා / අයිවෝ ඩෙනිස් මහතා

59) සුළඟ හමායන වේගය මැනීම සඳහා භාවිත කරනු ලබන උපකරණය නම්,

අනිලමානය. / ඇමීටරය. / සුළං දිශා දර්ශකය

60) මින්නේරිය වැව ඉදිකරවන ලද්දේ කුමන රජතුමාගේ කාලයේ ද?

මහසෙන් රජු. / දුටුගැමුණු රජු. / වලගම්බා රජු

ලකුණු 30